## අධිකරණ සේවා කොමිෂන් සභාව

### වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ නඩත්තු මණ්ඩලයෙහි සාමාජිකයින් පත්කිරීම - 2025

2011 අංක 05 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනතේ 08 වන වගන්තියෙන් සංශෝධනය වී ඇති 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ පනතේ 24 වන වගන්තිය අනුව, වසර තුනක (03) ක කාලසීමාවකට නඩත්තු මණ්ඩලයක් ස්ථාපිත කිරීමේ කාර්යය සඳහා පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව දැනුම හා පළපුරුද්ද ඇති ප්‍රවීන, විශ්වසනීය, මනා චරිතයකින් සහ යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් යුතු ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

1. නීතිය;
2. කළමනාකරණය;
3. මානව හිමිකම්;
4. සමාජ සේවා;
5. වෛද්‍ය වෘත්තිය හෝ උපදේශනය.

සියලුම අයදුම්පත් 2025.07.07 දින හෝ ඊට පෙර ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12 යන ලිපිනය වෙත එවිය යුතුය.

එම පත්කරගනු ලබන්නා වූ සාමාජික මණ්ඩලයෙහි නිලධාරීන් සඳහා පහත සඳහන් පරිදි දීමනා ගෙවනු ලැබේ.

1. සභාපති
   සියලු දීමනා ඇතුළත් මාසික දීමනාව - රු. 35,000

2. සාමාජිකයින් සඳහා
   උපරිම දින 05කට යටත්ව දිනකට ගෙවනු ලබන දීමනාව - රු. 5,000

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. එස්. සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2025 ජුනි මස 02 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

06-47